| බුද්ධි පරීක්ෂණය | සේවයේ රාජකාරී සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. | පැය 02 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | තනතුරට අදාළ තාක්ෂණික දැනුම මැන බැලීම සඳහා මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. | පැය 01 1/2 | 100 | 40% |

05. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

(i) බඳවාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

(ii) පත්කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනුලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iii) අයදුම්පත් තම ස්ථිර සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා මඟින් සහතික කර යොමු කිරීමට වග බලා ගත යුතුය. විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවෙකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන තමා සේවය කරන ආයතන ප්‍රධානියා ලවා සහතික කරගත යුතුය.

(iv) පළපුරුද්ද තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් සහතික කළ යුතුය.

(v) මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(vi) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

(vii) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය (MN 03-2006 -ඒ) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට ද සෞඛ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(viii) ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

06. අයදුම් කළ යුතු ක්‍රමය :

(i) අයදුම්කරුවන් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කර ගත් අයදුම්පත පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර කිසිදු නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණය (MN03-2006 -ඒ) ..........................................(ඉල්ලුම් කරන තනතුරේ නම සඳහන් කරන්න.) තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත - 2023" යනුවෙන් සඳහන් කර අධ්‍යක්ෂ (පාලන) 07 ශාඛාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(iii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය : **2024.04.08**

(iv) විභාග ගාස්තුව රු. 1000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සෞඛ්‍ය ලේකම් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි, මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි දක්වා ඇති කොටුව තුළ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවනු හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කරනු නොලබන අතර මතු ප්‍රයෝජනය සඳහා මුදල් ගෙවන ලද රිසිට්පතෙහි සහ අයදුම්පත්‍රයෙහි පිටපතක් ළඟ තබා ගැනීම සුදුසුය. (මුදල් ඇනවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(v) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

(vi) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :
විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහා ම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.
(i) ජාතික හැඳුනුම්පත,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(iii) වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය.

එමෙන් ම විභාග ශාලාවට ඇතුළු වීමේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාව වෙත ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙස් විභාග ප්‍රවේශ පත්‍රය මඟින් ඔබට දන්වනු ලැබේ. විභාගය සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළු කර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතුවේ.

08. *අත්සන සහතික කිරීම* :
රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරී සේවයේ රු.240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම :
අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවක දී අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. විභාග කොන්දේසි :-

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ කර තිබිය යුතු ය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් ලැබුන බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iv) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරඟ විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(v) ඉහත පරීක්ෂණ දෙකෙන්ම සමත් වූවන් පමණක් බඳවා ගැනීමේ විභාගය සමත් නිලධාරීන් ලෙස සලකනු ලැබේ. තරඟ විභාගයේ දී ලබා ගන්නා ලකුණුවල කුසලතාව අනුව සම්මුඛ පරීක්ෂණයක් මඟින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද නිලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

(vi) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය.

සැලකිය යුතුය :

(i) අයදුම්පතේ සෑම වගන්තියක් ම සම්පූර්ණකර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතුය.

(ii) අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයාගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධන නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(iii) අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් ම දරාගත යුතුය.

(iv) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(v) තනතුරු සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනයෙන් ආවරණයවන හෝ නොවන යම් කරුණ-ක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එසේම මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

වෛද්‍ය පී. ජී. මහීපාල,
ලේකම්,
සෞඛ්‍ය අමාත්‍යාංශය.

2024 පෙබරවාරි මස 28 වැනි දින,
සෞඛ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

අයදුම්පත්‍රය

සෞඛ්‍ය අමාත්‍යාංශයෙහි ශ්‍රී ලංකා තාක්ෂණ සේවාවට අයත් අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන / තාක්ෂණික සේවා ගණයේ (MN 03 -2006 -ඒ) විකලාංග වැඩපල කාර්මික ශිල්පී III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය : (සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E) ☐ පදිංචි දිස්ත්‍රික්කය : ☐

01.
(i) මුලකුරු සමග නම :————.
(සිංහලෙන් / දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

(iii) මුලකුරු සමඟ නම : Mr./Mrs./Miss
:————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- Mr./~~Mrs./Miss~~/SILVA A.B.

(iv) සම්පූර්ණ නම :————. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. පදිංචි ලිපිනය
(i) ස්ථිර පදිංචි ලිපිනය :————.

(ii) ස්ථිර පදිංචි ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)

03. උපන් දිනය :

| වර්ෂය | | | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

| වර්ෂ | | | | | මාස | | | දින | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|

04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. දුරකථන අංකය : පෞද්ගලික (ජංගම) :————. ස්ථාවර :————.

06. විද්‍යුත් ලිපිනය :————.

07. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

08. ශ්‍රී ලංකා පුරවැසියෙකුද යන බව : ඔව් ☐ නැත ☐

09. විවාහක / අවිවාහක බව :————.

10. අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය ඃ

වර්ෂය :————. විභාග අංකය :————.

| අ/අ | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

වර්ෂය :————. විභාග අංකය :————.

| අ/අ | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |

(ඇ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(වෘත්තීය හා කාර්මික සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද ඃ.................................................................
.............................................................................................
.............................................................................................

11. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය ඃ

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :————.

II. ගෙවූ මුදල :————.

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 1000.00 මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>(අයදුම්පතෙහි සහ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් වනු ඇත.) |

12. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් තොරතුරු බවට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසි වන්දියක් නොමැතිව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ඃ

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී ..................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

සහතික කරන ලද නිලධාරියාගේ,
සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

14. දැනට රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ කටයුතු කරන *ගැසට්* නිවේදනයේ දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් පහත කරුණු අදාළ වේ.

14.1. දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තරය

i. නිලධාරියාගේ නම :————.
ii. ස්ථිර සේවා ස්ථානය හා ලිපිනය :————.
iii. ස්ථිර සේවා ස්ථානයේ දුරකථන අංකය :————.
iv. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :————.
v. විභාගයට අයදුම්කරන අවස්ථාවේදී දරන තනතුර :————.
vi. එම තනතුරට පත්වීම් ලැබූ දිනය :————.
vii. එම තනතුරේ ස්ථිර තිබේද? ("ඔව්" නම් ස්ථිර කරන ලද දිනය සඳහන් කරන්න) :————.
viii. සේවා කාලය තුළදී විනයානුකූල දඬුවම් ලබා තිබේද? ("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.
ix. මේ වන විට විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද? ("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.
x. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද?("ඔව්" නම් ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න) :————.

මෙම අයදුම්කරු වන ....................................... මයා / මිය / මෙනවිය ආයතනයේ ........................ වැනි දින සිට ........................ (තනතුර සඳහන් කරන්න) සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. ඉහත 14 කරුණ යටතේ සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින / නොහරින බවත් මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ආයතන ප්‍රධානියා අත්සන

අත්සන :————.
නම :————.
පදවි නාමය :————.
දිනය :————.
දෙපාර්තමේන්තුව / ආයතනය :————.
(රබර් මුද්‍රාවෙන් සනාථ කරන්න)

03-178

### අධ්‍යාපන අමාත්‍යාංශය

### සීමිත පදනම මත අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2024

01. රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ නිලධාරී කමිටුවේ 2022.11.10 (හයවන රැස්වීම) දිනැති වාර්තාව අනුව හා අංක අමප/22/2034/605/011-II දරන හා 2022.12.20 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ද රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/02/-07/02/2018 හා 2023.03.27 දිනැති ලිපියද අනුව මෙම අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී පුරප්පාඩු සඳහා 80 දෙනෙකු සීමිත පදනම මත උසස් කිරීම මගින් පත්කරනු ලබන අතර ඒ සඳහා පවත්වනු ලබන විභාගය **2024 ජූලි මස 13 දින** කොළඹ දී පවත්වනු ලැබේ.

02. 2016.02.25 දිනැති හා අංක 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN1 - 2016 වැටුප් කේතය මෙම තනතුරට හිමිවන අතර එයට අදාළ මාසික වැටුප් පරිමාණය රු. 27,140- 300x10 -350 x 11- 495 x 10 -660 x 10 - රු. 45,540ක් වේ.

03. ඇගයීම් ක්‍රමවේදය :-

සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරේ පවතින පුරප්පාඩු සඳහා 80 දෙනෙකු සීමිත පදනම මත බඳවාගැනීම සිදු කර පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරනු ලැබේ. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන විෂයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයකට මුහුණ දී එක් එක් විෂය සඳහා අවම වශයෙන් ලකුණු 40ක් බැගින් ලබා සමත් විය යුතුය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ.) ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

| | මුළු ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) (කාලය පැය 01) | 100 |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) (කාලය පැය 01) | 100 |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 |

3.1. ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර :
මෙම ලිඛිත විභාගය පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ. මෙම ලිඛිත පරීක්ෂණය **2024 ජූලි මස 13 කොළඹ** දී පවත්වනු ලැබේ.

I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100)

සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී (පිරිමි)/ සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී (ගැහැණු) තනතුරට අදාළ රාජකාරී, නේවාසික සිසුන්ගේ විනය, ආරක්ෂාව, සුහසාධනය හා ආහාර සැපයීම යන කටයුතු කරගෙන යාම හා එම කටයුතු ඉටුකරලීමේ දී ශිෂ්‍ය නිවාස අධිකාරීට සහාය දැක්වීම, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සුහසිද්ධිය, නේවාසික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීම, ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමට අදාළ පොත්පත් ලේඛන පවත්වාගෙන යාම, මිල දී ගැනීම, ආරක්ෂා කිරීම හා නිකුත් කිරීම පිළිබඳ කටයුතු, ආහාර පාන පිසීම පිළිබඳ පරීක්ෂා කිරීම, මුළුතැන්ගෙයි මෙවලම් පිළිබඳ පවිත්‍රතාව, නේවාසිකාගාරය පිරිසිදුව තැබීමට විධිවිධාන යෙදීම, රෝගාතුර වූ සිසුන් පිළිබඳ කටයුතු, රජය සතු දේ ආරක්ෂා කිරීම පිළිබඳ කටයුතු,පවිත්‍රතාව පවත්වාගෙන යාමට අදාළ කටයුතු, ආහාර පාන පිළියෙළ කිරීම පිළිබද කටයුතු, ආහාර ගන්නා අවස්ථාව පිළිබඳ අධීක්ෂණ කටයුතු, නේවාසිකාගාරවල ජලය, විදුලිය විධිමත්ව සැපයීමට අදාළ කටයුතු, නේවාසිකයින් නේවාසිකාගාරයෙන් බැහැරවීම හා පැමිණීම පිළිබඳ කාර්යයන් හා තනතුරට අදාළ ආයතන ප්‍රධානීන් පවරනු ලබන වෙනත් රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100)

අපේක්ෂකයින්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

3.2. යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50)
ඉහත සඳහන් කරන ලද පරීක්ෂණ මණ්ඩලය විසින් 3.2.1 යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ.

ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුයි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

3.2.1. අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ශ්‍රේණිය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබාදීමේ පටිපාටිය - 2024

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු | |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i. අ.පො.ස (සා.පෙළ) විභාගය | ● විශිෂ්ට සාමාර්ථය - එක් විෂයකට ලකුණු 02 බැගින්<br>● අධි සම්මාන - එක් විෂයකට ලකුණු 01 බැගින්<br>● සම්මාන - එක් විෂයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි හා තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථය ලබා තිබීමට අමතරව ) | 10 | 15 |
| ii. අ.පො.ස (උ.පෙළ) විභාගය | ● විශිෂ්ට සාමාර්ථය- එක් විෂයකට ලකුණු 2 බැගින්<br>● අධි සම්මාන- එක් විෂයකට ලකුණු 1 බැගින්<br>● සම්මාන - එක් විෂයකට ලකුණු 0.5 බැගින් | 5 | |
| iii. උපාධි | | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකට ම ලකුණු 02 බැගින් | 15 | 15 |
| 03. පරිගණක හැකියාව :<br>■ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | 5 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මගින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | 5 |
| | අ.පො.ස. (උ.පෙළ) විභාගයේ දී විෂයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (1 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>● තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | 5 |
| | ඇගයීම් එක් ලිපියකට - එක ලකුණ බැගින්<br>● තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | 5 |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.)

04. මේ සඳහා පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණය **2024 ජූලි මස 13 වැනි දින කොළඹ දී** පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ට බලය ඇත.

05. සුදුසුකම්:-

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන හා ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා ගණයට අයත් තනතුරුධාරීන්ට සීමිත පදනම මත සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට අයදුම් කිරීමට,

(අ) අධ්‍යාපන සුදුසුකම්: -

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී මව් භාෂාව, ගණිතය යන විෂයන් සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

(ආ) පළපුරුද්ද : -

නියමිත දිනට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙන් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(ඇ) වෙනත් සුදුසුකම්:-

I. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතුය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත්කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති වීම.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබීම.

VI. සෑම අපේක්ෂකයකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය: -

(අ) අයදුම්පත මෙම චක්‍රලේඛයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර එය A4ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත ම යොදා ගනිමින් අපේක්ෂකයා විසින් ම සම්පූර්ණ කළ යුතුය. අයදුම්පතේ ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමු පිටුවට ද 05 සිට 09 තෙක් දෙවන පිටුවට ද 10 සිට 14 තෙක් තෙවන පිටුවට ඉතිරිය සිව්වන පිටුවට ද ලෙස ගෙන සකස් කළ යුතුය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්, කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. අදාළ අයදුම්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) ලිඛිත පරීක්ෂණය සිංහල සහ දෙමළ යන භාෂාවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයින්ට තමන් සේවයට බැඳුණු භාෂා මාධ්‍යයෙන් හෝ වෙනත් රාජ්‍ය භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය. අයදුම්පත සකස් කිරීම හා සම්පූර්ණ කිරීම කළ යුත්තේ තමන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීමට අපේක්ෂා කරනු ලබන භාෂා මාධ්‍යයෙන්මය. ඉල්ලුම් කරන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්පත පිළියෙලකර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන සම්පූර්ණ කළ අයදුම්පත් ජාතික පාසලක, ගුරු මධ්‍යස්ථානයක හෝ ගුරු විද්‍යාලයක සේවය කරන අයදුම්කරුවකු නම් අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ද විද්‍යාපීඨයක සේවය කරන අයදුම්කරුවකු නම් පීඨාධිපති මගින්ද ලියාපදිංචි තැපෑලෙන් **2024.03.25** දින හෝ එදිනට පෙර ලැබෙන සේ,

විභාග කොමසාරිස් ජනරාල්,<br>
ආයතනික විභාග සංවිධාන ශාඛාව,<br>
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,<br>
තැ.පෙ 1503,<br>
කොළඹ.

යන ලිපිනයට එවිය යුතුයි. අයදුම්පත් එවීමේ දී ඒවා බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සීමිත පදනම මත සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරී තනතුරට බඳවා ගැනීමේ විභාගය - 2024" යනුවෙන් සඳහන් කළ යුතුය.

(ඈ) නිලධාරීන් විසින් සම්පූර්ණකර ඉදිරිපත් කරන අයදුම්පත් තම කාර්යාලයට ලද දිනයේ දී ම කාර්යාලයීය දින මුද්‍රාව තබා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර, සහතික කළ දිනය ද සහිතව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර ඉහතින් දක්වන ලද ලිපිනයට ලැබෙන සේ ජාතික පාසල් විදුහල්පතිවරුන්/ගුරු විද්‍යාල විදුහල්පතිවරුන්/ගුරු මධ්‍යස්ථාන කළමණාකරුවන් විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් යොමු කිරීමට කටයුතු කළ යුතු අතර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සේවයේ නියුතු වූවන් පීඨාධිපති මගින් යොමු කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) සංස්ථාවක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක සේවය සඳහා මුදාහරිනු ලැබ ඇති / සේවය සඳහා ද්විතීයනය කර ඇති නිලධාරින් සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අයදුම්පත් සහතික කොට ඉහත දැක්වෙන ආකාරයට එවිය යුතුයි.

(ඊ) නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී ප්‍රමාදවන හෝ නැතිවන අයදුම්පත් පිළිබඳව ද මෙම නිවේදනයේ සඳහන් කර ඇති ලිපිනයට හැර වෙනත් අය වෙත යොමු කෙරෙන අයදුම්පත් පිළිබඳව ද පැමිණිලි සලකා බලනු නොලැබේ.

(උ) ඉල්ලුම් කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර හා සේවා ස්ථානය මේ සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්වීම් කිසිවක් සලකා බලනු නොලැබේ.

07. විභාග ගාස්තු:-

විභාග ගාස්තුව රු. 600/= කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂය 20-03-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට/දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතුය. අයදුම්කරුවන්ගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දාරයක් මඟින් අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් විය හැක.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදුකරනු නොලැබේ.

08. විභාගයට ඇතුළත්වීම : -

(අ) ලිඛිත පරීක්ෂණය සඳහා වන අයදුම්පත පිළිගත් සියලුම අපේක්ෂකයන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත්කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ දී එහි ශාලාධිපතිට තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) විභාග අපේක්ෂකයින් තමන්ට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතුය.

(ඇ) අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළකරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පතෙහි පිටපත ද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන්කර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මඟින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකය ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායි වනු ඇත.

(ඈ) ලිඛිත පරීක්ෂණයේ ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් පරීක්ෂණ මණ්ඩලය ලබා දෙන ලකුණුවල මුළු එකතුව අනුව කුසලතා අනුපිළිවෙළට සකස්කළ ප්‍රතිඵල ලේඛනය විභාග කොමසාරිස් ජනරාල් විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. එසේ ලබා දීමෙන් අනතුරුව විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) විභාග කොමසාරිස් ජනරාල් විසින් ලබා දුන් අවසාන ප්‍රතිඵල ලේඛනය අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.

*සටහන* :- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත්කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

09. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහිමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේම තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරින්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. **සාවද්‍ය තොරතුරු සැපයීම් සඳහා දඬුවම්: -**

(අ) මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකුට ඊට පෙනී සිටීම නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

(ආ) අපේක්ෂකයකු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත් එසේත් නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය රජයේ සේවයෙන් පහකරනු ලැබීමට යටත් වනු ඇත.

(ඇ) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත්කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. **පත්වීම් සඳහා තෝරා ගැනීම : -**
යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ලිඛිත පරීක්ෂණයෙන් ලැබූ මුළු ලකුණු සංඛ්‍යාව අනුගමනය කරමින් පුරවනු ලබන පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව තෝරා ගනු ලැබේ. (ලිඛිත පරීක්ෂණය සඳහා අවම ලකුණු 40ක් ලබාගැනීම අනිවාර්ය වේ. එසේම අවම ලකුණු 40ක් ලබා නොගන්නා අයදුම්කරුවන් මෙම පත්වීම සඳහා සුදුස්සන් නොවේ.)

12. විභාගයෙන් සමත්වන යම් අපේක්ෂකයකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ, හැසිරීම් කරණකොට ගෙන පත්වීම් නොදීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

13. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව තීරණ ගැනීම ද අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.

14. මෙම දැන්වීමේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේය.

වසන්තා පෙරේරා,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය"
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 2 සේවා ගණයේ
සීමිත පදනම සහකාර ශිෂ්‍ය නිවාස අධිකාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගය - 2024

Competitive Examination for Recruitment to the Post of Assistant superintendent of Hostel in the Management Assistant (Non Technical) Segment II Service Category of the Ministry of Education - 2024

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : සිංහල - 2 [ ]
දෙමළ - 3
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

ඔබ අයත් වන සේවා ගණය : [ ]

***සැලකිය යුතුයි*** :-අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය නොවන, ප්‍රාථමික අර්ධ ශිල්පීය හා ප්‍රාථමික ශිල්පීය නිලධාරීන් සඳහා පමණි.

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.3 මුලකුරු සමඟ නම(සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 රාජකාරි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට එවනු ලැබේ)

2.2 රාජකාරි ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.4 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.5 ජංගම දුරකතන අංකය : | | | | | | | | | | |

03. උපන් දිනය :-

වර්ෂය : | | | | | මාසය : | | | දිනය : | | |

04 ස්ත්‍රී / පුරුෂභාවය (අදාළ අංකය කොටුව තුළ ලියන්න.):

පුරුෂ - 0

ස්ත්‍රී - 1

05. දැනට දරන තනතුර (පත්වීම් ලිපියේ සඳහන් පරිදි) ..........................................................
..........................................................................................................
..........................................................................................................

6.1 පත්වීම් ලිපියේ අංකය : ..........................................................
6.2 පත්වීම් දිනය :..........................................................

06. ඉකුත් වසර 05 තුළ ඔබගේ කැපී පෙනෙන කාර්ය සිද්ධීන් ලෙස ඔබ සලකන්නේ මොනවාද?

..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

07. ඉකුත් අවුරුදු 05 තුළ ඔබේ කාර්ය සාධන වාර්තාවල අයහපත් සටහන් වාර්තා කර තිබේද?
..........................................................................................................
..........................................................................................................

එසේනම් විස්තර දක්වන්න.
..........................................................................................................
..........................................................................................................

08. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පූර්වාසන්න පස් අවුරුදු කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබේ.ද?
..............................................................................................................
..............................................................................................................

2018.12.31 දිනට පසුව උපයා නොගත් වැටුප් වර්ධක වේ නම් එසේ වීමට හේතු දක්වන්න
..............................................................................................................
..............................................................................................................

09 ඉකුත් අවුරුදු 05 තුළ විනයානුකුල නීති යටතේ ඔබට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇත් ද ?
..............................................................................................................

එසේ නම් වරදේ සහ පනවන ලද දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර
..............................................................................................................
..............................................................................................................

10. ඔබේ සේවා කාලය තුළ මොනයම් අවස්ථාවක හෝ වංකභාවය පිළිබඳ යම් ක්‍රියාවකට හෝ දූරාචාරයකට තුඩු දෙන වෙනත් විෂමාචාර ක්‍රියාවකට දඬුවම් ලබා ඇත්ද?
..............................................................................................................

එසේනම් වරදේ ස්වභාවය,දෙන ලද දඬුවම සහ දඬුවම් කළ දිනය ආදි විස්තර සඳහන් කරන්න.
..............................................................................................................

11. ඉහත 9 හි දැක්වෙන අයහපත් සටහන් හෝ ඉහත 10 හි සඳහන් විනයානුකුල ක්‍රියාකිරීම ගැන ඔබට නිරීක්ෂණ කිසිවක් තිබේද?
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

12. විශේෂ සුදුසුකම්
..............................................................................................................
..............................................................................................................
..............................................................................................................

13. විභාග ගාස්තුව ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය
I. විභාග ගාස්තුව ගෙවූ කාර්යාලය : ..............................................................
II. ලදුපත් අංකය : ..............................................................
III. ගෙවූ මුදල : ..............................................................

| ලදුපතෙහි එක් දාරයකින් මෙහි අලවන්න. (අදාළ නම් පමණි.)<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) |
|---|

14. අයදුම්කරුගේ ප්‍රකාශය :

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරුවල නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තනතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණ වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත්කර ගැනීමෙන් පසු අනාවරණ වුවහොත් මා සේවයෙන් පහ කිරීමට හැකි බවත්, මම දනිමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අපේක්ෂකයාගේ/අපේක්ෂිකාවගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිටදී)

දිනය :————.

*සටහන* - තම දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවට අත්සන් කිරීමට බලය ලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

15. අත්සන සහතික කිරීම:

මගේ කාර්යාලයේ/විදුහලේ/විද්‍යා පීඨයේ/ගුරු විදුහලේ/ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන .................................................... මයා/මිය/මෙනවිය ........................... දින මා ඉදිරිපිටදී අත්සන් කළ බවද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව
(ආසන්නතම මාණ්ඩලික නිලධාරී / විදුහල්පති.)

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.

16. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :

1. ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
2. නිලධාරියා/නිලධාරිනිය මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් ඇති බවත්,
3. නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත අලවා ඇති බව සහතික කරමි.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ/පීඨාධිපතිගේ
අත්සන හා නිල මුද්‍රාව

නම :—————.
පදවි නාමය :—————.
ලිපිනය :—————.
දිනය :—————.
(අදාළ නොවන වචන කපා හරින්න.)

03-107

---

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව**

ඒකාබද්ධ රේගු සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීම

2018.11.18 වැනි දින විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වන ලද ඉහත සඳහන් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පහත නම් සඳහන් අයදුම්කරුවන් ඒකාබද්ධ රේගු සේවයේ සහකාර අධිකාරී II වැනි ශ්‍රේණියට 2019.06.20 වැනි දින සිට බඳවා ගන්නා ලදී.

| *අනු අංකය* | *නිලධාරියාගේ නම* | *ලිපිනය* |
|---|---|---|
| 1 | කේ. ඩබ්. ඩී. සේනාරත්න මයා | අංක 65, පිටුම්පෙ, පාදුක්ක. |
| 2 | ඒ. ආර්. එච්. පොත්පිටිය මයා | අංක 84/3, මාගම්මන පාර, හත්ලහගොඩ, හෝමාගම. |

| අනු අංකය | නිලධාරියාගේ නම | ලිපිනය |
|---|---|---|
| 3 | කේ.ඩී. ජයවර්ධන මයා | අංක 17/75, පන්සල පාර, පානදුගම, අකුරැස්ස. |
| 4 | ඩබ්.ජී.ඩී. තාරක මයා | අංක 145/12 ඒ, ළහිරු උයන, දියගම, කිරිවත්තුඩුව. |
| 5 | ඩී.ඒ.සී.ආර්. ප්‍රභාත් මයා | අංක 413/19 බී, පළමු පටුමග, කුඩගහපිටිය, හැඳල, වත්තල. |
| 6 | ඩබ්ලිව්.යූ.එම්. පෙරේරා මයා | අංක 734, බුන්කිඳ පාර, යක්කඩුව, ජාඇල. |
| 7 | ඩබ්ලිව්.බී.සී. කුමාරසිරි මයා | අංක 157/1, වත්තේ ගෙදර පාර, මහරගම. |
| 8 | එස්.ඩී.ටී.පී. විරතිසුන් මයා | අංක 11/1ඒ/1, පරකන්දෙණිය, ඉඹුල්ගොඩ. |
| 9 | එම්.එම්.එම්. මුර්සිදීන් මයා | අංක 225, ෆිෂරීස් ස්ට්‍රීට්, ඕඩ්ඩමාවඩි 03. |
| 10 | කේ.ඩී.එස්. ජයසූරිය මයා | අංක 161/11, මාදිවෙල පාර, උඩහමුල්ල, නුගේගොඩ. |
| 11 | එච්.ආර්.සී.වී. කුමාර මයා | අංක 28/22, බුද්ධාලෝක මාවත, ස්වාරපොළ, පිළියන්දල. |
| 12 | M.P.D.L. LUPHZHY මෙනවිය | අංක 421A, MAWADY ROAD, SAINTHAMARUTHU 3. |
| 13 | එස්.ඒ.ඩී.වී. දීමන්ත මයා | අංක 93/සී/1, ආරිය මාවත, උතුරු කලුවාරිප්පුව, කටාන. |
| 14 | කේ.එස්.ටී.එන්. ප්‍රේමචන්ද්‍ර මයා | අංක 07, ෆර්නි ලංකා පාර, වල්පොල, රුක්ගහවිල. |
| 15 | එච්.කේ.ජේ. අමරසිංහ මෙනවිය | අංක 33ඩී. පළමු පටුමග, රබර් වත්ත පාර,ගංගොඩවිල, නුගේගොඩ. |
